**ඌව පළාත් සභාව**
**භාවිතා කරන ලද සුඛෝපභෝගී වාහනය විකිණීම සඳහා**
**ලංසු ආරාධනාව**

ඌව පළාත් සභාවට අයත් පහත සඳහන් වාහනය ජාතික තරඟකාරී ලංසු කැඳවීම මඟින් විකිණීම පිණිස මිල ගණන් කැඳවනු ලැබේ.

**භාවිතා කරන ලද ලියාපදිංචි රථ ලෙස විකිණීමට නියමිත වාහන**

| අනු අංකය | වාහනයේ අංකය | වර්ගය | මාදිලිය | නිෂ්පාදිත වර්ෂය | ආපසු ගෙවන ලංසු සුරක්ෂණ මුදල (රු.) | ආපසු නොගෙවන තැන්පතු මුදල (රු.) |
|---|---|---|---|---|---|---|
| 1 | UP CAG-7655 | BMW | 730 D | 2015 | 400,000.00 | 3000.00 |

02. විකිණීමට නියමිත ඉහත සඳහන් වාහනය ඌව පළාත් ප්‍රධාන අමාත්‍ය නිල නිවස පරිශ්‍රයේ ගාල් කර ඇති අතර, එම වාහනය **2025.11.24 සිට 2025.12.19 දක්වා සතියේ වැඩ කරන දිනයන්හි පෙ.ව 9.00 සිට ප.ව.3.00 දක්වා** පරික්ෂා කර බැලිය හැකි අතර ඒ සඳහා විස්තර පත්‍රිකාව සහ වාහනය පරීක්ෂා කිරීමේ අවසර පත්‍රය ඇතුලත් ලංසු ලියවිලි, වාහනය සඳහා ආපසු නොගෙවනු ලබන **රු.3000.00ක** මුදල නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුල්‍ය කළමනාකරණ) කාර්යාලය වෙත මුදලින් ගෙවා ලබාගත් රිසිට් පත් ඉදිරිපත් කිරීමෙන් පසුව ලබා ගත හැකිය.

03. ලංසු ඉදිරිපත් කරනු ලබන වාහනය සඳහා ඊට අදාල ආපසු ගෙවනු ලබන ලංසු සුරක්ෂණ තැන්පතු මුදල "ප්‍රධාන ලේකම් ඌව පළාත් සභාව'' නමින් පිළිගත් වාණිජ බැංකුවකින් ලබාගත් 2026.02.09 දින දක්වා වලංගු කොන්දේසි විරහිත ලංසු සුරක්ෂණයක් හෝ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුල්‍ය කළමනාකරණ) කාර්යාලය වෙත මුදලින් ගෙවා ලබා ගත් රිසිට්පතේ ඡායා පිටපතක් ලංසු ලියකියවිලි සමඟ ඉදිරිපත් කල යුතු වන අතර, එසේ නොවන ලංසුපත ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. ලංසුවේ ඇතුලත් විය යුතු ලේඛන

- පුරවා අත්සන් කරන ලද "අ'' ආකෘති පත්‍රය
- පුරවා අත්සන් කරන ලද "ආ'' ලංසු පත්‍රිකාව(පළමු පිටපත සහ අනු පිටපත)
- ආපසු ගෙවනු ලබන ලංසු සුරක්ෂණ මුදල ගෙවූ රිසිට්පතේ ඡායා පිටපත හෝ පිලිගත් වාණිජ බැංකුවකින් ලබාගත් 2026.02.09 දින දක්වා වලංගු කොන්දේසි විරහිත ලංසු සුරක්ෂණයේ මුල් පිටපත
- අත්සන් කරන ලද කොන්දේසි පත්‍රිකාව

(ඉහත ලේඛන එකක් හෝ ඊට වැඩි ගණනක් අඩුවෙන් හා පුරවා අත්සන් කර නොමැතිව ලංසු ඉදිරිපත් කර ඇති විට එම ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.)

05. මීට පෙර මෙම කාර්යාලයෙන් වාහන විකිණීම සඳහා ලංසු කැඳවන අවස්ථාවන්හිදී මිල ගණන් ඉදිරිපත් කර සුදුසුකම් ලද එහෙත් එවා පිරිනැමීමෙන් පසු ප්‍රතික්ෂේප කල ලංසුකරුවන්ගේ මිල ගණන් මෙවර පිළිගනු නොලැබේ. මිල ගණන් පිලිගනු ලැබූ බව ලංසුකරුවන්ට දැනුම් දුන් පසු එසේ පිලිගත් බව දැනුම් දී දින 07 ක් ඇතුලත සම්පූර්ණ මුදල් ගෙවා එම වාහනය අදාල ස්ථානයෙන් ඉවත් කර ගත යුතුය.

06. නිසි පරිදි සම්පූර්ණ කරන ලද ලංසු ලියවිලි, මුල් පිටපත හා අනු පිටපත වශයෙන් පිටපත් දෙකකින් සකස් කර වෙන් වෙන් වශයෙන් කවර දෙකක බහා නැවත එම කවර දෙක එක් කවරයකට දමා කවරයෙහි වම්පස ඉදිරි කෙළවරේ **''අංක CAG -7655 (වාහනයේ අංකය) දරණ මෝටර් වාහනය සඳහා වූ ලංසු ලියවිලි''** යන්න සඳහන් කර. 2025.12.22 දින පෙ.ව. 10.00 ට පෙර ලැබෙන සේ **"ප්‍රධාන ලේකම්/සභාපති, ටෙන්ඩර් මණ්ඩලය, නියෝජ්‍ය ප්‍රධාන ලේකම් මුල්‍ය කළමනාකරණ කාර්යාලය, රජ විදිය, බදුල්ල ''**යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන්, කුරියර් සේවාව මඟින් එවීම හෝ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුල්‍ය) නිල කාමරයේ තබා ඇති ලංසු පෙට්ටියට අතින් ගෙනවිත් බහාලීම කල හැකිය. 2025.12.22 දින පෙ.ව. 10.30 ට එම කාර්යාලයේ දී ලංසු විවෘත කරනු ලබන අතර, ඒ සඳහා ලංසුකරුට හෝ ඔහුගේ බලයලත් බලය පැවරීමේ ලිපිය සහිත නියෝජිතයෙකුට එම අවස්ථාවට සහභාගී විය හැකි අතර අනන්‍යතාව තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත රැගෙන පැමිණීම අනිවාර්ය වේ. ඉදිරිපත් වන ලංසු සම්බන්ධයෙන් ටෙන්ඩර් මණ්ඩලයේ තීරණය අවසන් තීරණය වේ.

07. සාරානුකූලව ප්‍රතිචාර දක්වා ඇති ලංසුකරුවන් අතරින් ඉහළම මිල ඉදිරිපත් කර ඇති ලංසුකරු සඳහා පමණක් වාහනය විකිණීම සිදු කරන අතර, ඒ සඳහා වෙනත් ලංසුකරුවකු සලකා බැලීම සිදු නොවේ.

08. මේ පිළිබඳ වැඩි විස්තර ඌව පළාත් සභාවේ ප්‍රධාන ලේකම් කාර්යාලයේ නිල වෙබ් අඩවිය වන cs.up.gov.lk වෙත පිවිසීමෙන්ද දුරකථන අංක 055 2231175 (අධ්‍යක්ෂ - මුල්‍ය) ඇමතීමෙන් ද ලබා ගත හැක.

**ප්‍රධාන ලේකම්/සභාපති,**
**ටෙන්ඩර් මණ්ඩලය,**
**නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය කළමනාකරණ) කාර්යාලය,**
**රජ විදිය,**
**බදුල්ල.**
**2025.11.24 දින,**

**ඌව පළාත් සභාව**

**භාවිතා කරන ලද සුඛෝපභෝගී වාහන විකිණීම සඳහා වූ සාමාන්‍ය ලංසු කොන්දේසි**

වාහන මිලදී ගැනීම සඳහා මිල ගණන් ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරන පාර්ශවයන් (ගැණුම්කරුවන්) විසින් පහත ලේඛන ඇතුලත්ව තම ලංසුව මුල් පිටපත හා අනු පිටපත වශයෙන් පිටපත් දෙකකින් සකස් කර වෙන් වෙන් වශයෙන් කවර දෙකක බහා නැවත එම කවර දෙක එක් කවරයකට දමා සකස් කර මුද්‍රා තබා කවරයෙහි වම්පස ඉදිරි කෙළවරේ **"අංක CAG-7655 (වාහනයේ අංකය) දරණ මෝටර් වාහනය සඳහා වූ ලංසු ලියවිලි"** යන්න සඳහන් කළ යුතුය. **"ප්‍රධාන ලේකම්/සභාපති, ටෙන්ඩර් මණ්ඩලය, නියෝජ්‍ය ප්‍රධාන ලේකම් මූල්‍ය කළමනාකරණ කාර්යාලය, රජ විදිය බදුල්ල "** යන ලිපිනයට 2025.12.22 දින පෙ.ව. 10.00 හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන්, කූරියර් සේවාව මගින් එවීම හෝ අතින් ගෙනවිත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(මූල්‍ය) නිල කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම මගින් ලංසු ඉදිරිපත් කල යුතු වේ.

ලංසුවේ ඇතුලත් විය යුතු ලේඛන

- පුරවා අත්සන් කරන ලද "අ" ආකෘති පත්‍රය
- පුරවා අත්සන් කරන ලද"ආ" ලංසු පත්‍රිකාව(පළමු පිටපත සහ අනු පිටපත)
- ආපසු ගෙවනු ලබන ලංසු සුරක්ෂණ මුදල මුදලින් ගෙවූ රිසිට්පතේ ඡායා පිටපත හෝ පිළිගත් වාණිජ බැංකුවකින් ලබාගත් 2026.02.09 දින දක්වා වලංගු කොන්දේසි විරහිත ලංසු සුරක්ෂණයේ මුල් පිටපත
- අත්සන් කරන ලද කොන්දේසි පත්‍රිකාව

(ඉහත ලේඛන එකක් හෝ ඊට වැඩි ගණනක් අඩුවෙන් හා පුරවා අත්සන් කර නොමැතිව ලංසු ඉදිරිපත් කර ඇති විට එම ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ)

01. ආපසු නොගෙවනු ලබන ගාස්තුව 2025.11.24 සිට 2025.12.19 දින දක්වා පෙ.ව 9.00 සිට ප.ව 3.00 දක්වා සතියේ වැඩ කරන දිනයන්හි ඌව පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය කළමනාකරණ) කාර්යාලය වෙත මුදලින් ගෙවා මීට අදාල ලංසු ලේඛන කට්ටලයක් හා වාහනය ගාල්කර ඇති පරිශ්‍රයට ඇතුළු වීමේ අවසර පත්‍රයක් ලබා ගත හැකිය.

02. ලංසු ඉදිරිපත් කරනු ලබන වාහනය පරීක්ෂා කර බලා ලංසු ආරාධනාවේ සඳහන් පරිදි, වාහනයට අදාල ආපසු ගෙවනු ලබන තැන්පතු මුදල නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය කළමනාකරණ) කාර්යාලය වෙත මුදලින් ගෙවා ලබා ගන්නා රිසිට් පතේ ඡායා පිටපතක් හෝ පිළිගත් වාණිජ බැංකුවකින් ලබාගත් 2026.02.04 දින දක්වා වලංගු කොන්දේසි විරහිත ලංසු සුරක්ෂණයේ මුල් පිටපත ලංසු ලේඛණ වලට අමුණා ඉදිරිපත් කළ යුතුය. එම ගෙවීම් විස්තර "(අ)" සහ "(ආ)" ආකෘතියේ ද සඳහන් කල යුතුය.

03. සාර්ථක ලංසුකරුවන් තෝරා ගැනිමෙන් පසු සෙසු ලංසුකරුවන්ගේ ආපසු ගෙවනු ලබන තැන්පත් මුදල් හෝ පිළිගත් වාණිජ බැංකුවකින් ලබාගත් 2026.02.09 දින දක්වා වලංගු කොන්දේසි විරහිත ලංසු සුරක්ෂණයේ මුල් පිටපත නිදහස් කරනු ලබන අතර, ලංසු සුරක්ෂණය මුදලින් ගෙවා ඇත්නම් ඒ සඳහා මුදල් ගෙවූ රිසිට්පතේ මුල් පිටපත සමඟ ලිඛිත ඉල්ලීමක් “ප්‍රධාන ලේකම්,ප්‍රධාන ලේකම් කාර්යාලය, ඌව පළාත’’ වෙත කළ යුතුය.

04. සම්පූර්ණ කරන ලද ලංසු 2025.11.24 දින සිට 2025.12.22 දින පෙ.ව.10.00 දක්වා සතියේ වැඩ කරන දිනයන්හි භාර ගනු ලබන අතර ප්‍රමාද වී ලැබෙන ලංසුපත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

05. තැපැලෙන් හෝ කූරියර් සේවාව මගින් එවනු ලබන ලංසුපත් 2025.12.22 දින පෙ.ව 10.00 ට පෙර ලැබෙන සේ එවිය යුතු අතර, කවරයෙහි වම්පස ඉදිරි කෙළවරේ **”අංක CAG-7655 (වාහනයේ අංකය) දරණ මෝටර් වාහනය සඳහා වූ ලංසු ලියවිලි”** යන්න සඳහන් කළ යුතුය.

06. තැපැල ප්‍රමාද වීම හෝ යම් හේතුවකින් ප්‍රමාද වී ලැබෙන ලංසුපත් සම්බන්ධයෙන් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) කාර්යාලය වග කියනු නොලැබේ.

07. මීට පෙර මෙම කාර්යාලයේ වාහන විකිණීම සඳහා ලංසු කැඳවන අවස්ථාවන්හිදී මිල ගණන් ඉදිරිපත් කර සුදුසුකම් ලද, එහෙත් ඒවා පිරිනැමූ පසු ප්‍රතික්ෂේප කරනු ලැබූ ලංසුකරුවන්ගේ මිල ගණන් මෙවර පිළිගනු නොලැබේ.

08. තක්සේරු මුදලට වඩා අඩු මිල ගණන් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

09. ඉදිරිපත් කරනු ලබන ලංසුවෙහි යම් කිසි වෙනසක් කරන්නේ නම් ලංසුකරුගේ කෙටි අත්සන එම ස්ථාන වල යෙදිය යුතුය. **ඉලක්කමෙන් සඳහන් කර ඇති මිල ගණන්, අකුරින් සඳහන් කර ඇති මිල ගණනට අසමාන නම් අකුරින් සඳහන් මිල ගණන් පිළිගනු ලැබේ.**

10. ඉදිරිපත් කරනු ලබන ලංසු පිළිගත් විට එය පිළිගත් බවට සාර්ථක ලංසුකරුවන් වෙත ඔවුන් ලංසු ලියවිලි වල සඳහන් කර ඇති ලිපිනයන්ට ලියාපදිංචි තැපැලෙන් දන්වා යවනු ලබන අතර, එසේ කිරීම අදාල කොන්දේසි සහ බැඳීම් සහිත ගිවිසුමකට එළඹීම ලෙස සැලකේ.

11. ඕනෑම ඉල්ලුම්පතක් පිළිගැනීමට හෝ සියළුම ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කිරීමට ටෙන්ඩර් මණ්ඩලයට බලය ඇත.

12. පහත සඳහන් වාහනය සඳහා සාර්ථක ටෙන්ඩර්කරු විසින් පවරා ගැනීමේ දී ඉදිරියෙන් සඳහන් කර ඇති බදු මුදල් ගෙවා ලියාපදිංචිය සිදුකරගත යුතුය, ඒ සම්බන්ධයෙන් කිසිදු වගකීමක් ඌව පළාත් ප්‍රධාන ලේකම් විසින් දරණු නොලැබේ.

| අනු.අං. | වාහනයේ අංකය | ශ්‍රී ලංකා රේගුව වෙත ගෙවිය යුතු බදු මුදල රු. | එකතුව රු. |
|---|---|---|---|
| 01 | UP CAG-7655 | 2,864,307.00 | 2,864,307.00 |

13. ලංසු පිළිගත් බව සාර්ථක ලංසුකරුවන් වෙත දැන්වීමෙන් පසු සතියේ වැඩ කරන දින හතක් (07) ඇතුලත වාහනය සඳහා ඔහු විසින් ඉදිරිපත් කර ඇති සම්පූර්ණ මුදල ඌව පළාත් සභාවේ ප්‍රධාන ලේකම් වෙත මුදලින් ගෙවිය යුතුය.ලංසු පිළිගැනීමේ ලිපියෙහි සඳහන් කර ඇති දින ගණන ඇතුළත ලංසුකරුවන් විසින් මුදල් ගෙවා වාහනය ගාල් කර තිබෙන පරිශ්‍රයෙන් ඉවත් කරගත යුතු වේ.

14. කිසියම් විශේෂ අවස්ථාවකදී හැර 13 ඡේදයේ සඳහන් අවශ්‍යතා සඳහා කාලය දිගු කිරීමට ඉඩ නොලැබෙන අතර, එවැනි විශේෂ දිගුවක් සඳහා කරනු ලබන ඉල්ලීමක් ඌව පළාත් සභාවේ ප්‍රධාන ලේකම්/ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් සලකා බලනු ලැබ ඔහුගේ අභිමතය පරිදි ඒ සඳහා තීරණය වනු ඇත.

15. වාහනය ඉවත් කර ගැනීම සාර්ථක ලංසුකරුවන්ගේ සම්පූර්ණ වියදමින් කල යුතු අතර, එම ඉවත් කර ගැනීම සාමාන්‍ය කාර්යාල දිනයන්හි පෙ.ව. 9.00 ත් ප.ව. 3.30 ත් අතර කල යුතුය.

16. නියම කර ඇති දින හතක් (07) ඇතුළත මුදල් ගෙවීම සිදු නොකළහොත් ඌව පළාත් සභාවේ අභිමතය පරිදි ප්‍රමාද ගාස්තු වශයෙන් දිනකට වාහනය සඳහා රු. 2,500.00 බැගින් ප්‍රමාද ගාස්තුවක් ගෙවීමට ලංසුකරුවන් යටත් කරනු ලැබේ (උපරිම දින 07ක් සඳහා පමණි).

17. මුළු මුදල, මුදලින් ගෙවීමට සාර්ථක ලංසුකරු අසමත් වුවහොත් හෝ ඌව පළාතේ ප්‍රධාන ලේකම් විසින් නියම කරනු ලබන වකවානුව තුල වාහනය ඉවත් කර ගැනීමට එම ලංසුකරු අසමත් වුවහොත්, ඌව පළාතේ ප්‍රධාන ලේකම්ගේ අභිමතය පරිදි එම වාහනය අලෙවි කිරීමට හෝ වෙනත් අයුරකින් ඉවත් කිරීමට කටයුතු යොදන අතර, සාර්ථක ලංසුකරුගේ ලංසු සුරක්ෂණ මුදල රජය සතු කිරීමෙන් ගිවිසුම්ගත කාර්යය භාරය ඔහු විසින් පැහැර හැරීම නිසා රජයට දැරීමට සිදුවන පාඩුව ඔහුගෙන් අයකර ගැනීමට පියවර ගනු ලැබේ.එසේම එම ලංසුකරු, අසාදු ලංසුකරුවන්ගේ නාම ලේඛනයට ඇතුළත් කිරීමටද කටයුතු කරනු ලැබේ.

18. සියළුම ලංසුකරුවන් අදාළ වාහනය කල් ඇතිව පරීක්ෂා කර එම වාහනයේ තත්වය පිළිබඳ මනා අවබෝධයකට පත්ව සිටිය යුතු වේ.ලංසු පිළිගැනීමෙන් පසු කරනු ලබන පැමිණිලි පිළිගනු නොලැබේ.

19. වාහනය වෙනුවෙන් මාස 03ක කාලයක් සඳහා ආදායම් බලපත්‍රය ලබා දෙනු ලබන අතර, ඒ වෙනුවෙන් නැවත දින දීර්ඝ කිරීමක් කරනු නොලැබේ.

20. සාරානුකූලව ප්‍රතිචාර දක්වා ඇති ලංසුකරුවන් අතරින් ඉහළම මිල ඉදිරිපත් කර ඇති ලංසුකරු සඳහා පමණක් වාහනය විකිණීම සිදු කරන අතර, ඒ සඳහා වෙනත් ලංසුකරුවකු සලකා බැලීම සිදු නොවේ.

21. මිල ගණන් ඉදිරිපත් කිරීමේ ලේඛනයේ නම සඳහන් පුද්ගලයාගේ නමින්ම ටෙන්ඩර් තැම්පතු (ආපසු ගෙවන හා ආපසු නොගෙවන) ගෙවීම සිදුකල යුතුය. සාර්ථක ටෙන්ඩර්කරුට වාහනයේ අයිතිය පැවරීමේ බලය ලබා දීමේ ලිපිය නිකුත් කරනු ලබන්නේ ඔහු/ඇය විසින් ඉදිරිපත් කරනු ලබන මිල ගණන් ඉදිරිපත් කිරීමේ ලේඛනයේ සඳහන් නමටය.

22. ලංසුවේ වලංගු කාලය 2026.02.09 දක්වා හෝ ඊට වැඩි විය යුතුය.

| | |
|---|---|
| *ආපසු ගෙවනු ලබන ලංසු සුරක්ෂණ මුදල/ආපසු නොගෙවනු ලබන ලංසු ලේඛන ගාස්තු ගෙවීම* | *2025.11.24 දින සිට 2025.12.19 දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව.9.00 සිට ප.ව.3.00 දක්වා* |
| *ලංසු භාරගැනීම* | *2025.11.24 දින සිට 2025.12.19 දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව.9.00 සිට ප.ව. 3.00 දක්වා හා 2025.12.22 වන දින පෙ.ව.9.00 සිට පෙ.ව. 10.00 දක්වා* |
| *ලංසු විවෘත කිරීම* | *2025.12.22 දින පෙ.ව. 10.30 ට* |

ඉහත කොන්දේසි වලට එකඟ වෙමි.

............................................
(ලංසුකරුගේ නම)

............................................
(ලංසුකරුගේ අත්සන)

**'අ' ආකෘතිය**

( ලංසුකරුගේ ලිපිනය)

-----------------------------------
-----------------------------------
-----------------------------------

ප්‍රධාන ලේකම්,
ඌව පළාත් සභාව,
බදුල්ල.

අංක ............................................................................ දරණ වාහනය සඳහා වූ ලංසු ඉදිරිපත් කිරිම.

රු. ............................................. ක් සඳහා වූ ලංසු තැන්පත්(ඇප තැන්පතු ගාස්තු)
කුවිතාන්සි අංකය : ...........................................................
හෝ පිළිගත් වාණිජ බැංකුවකින් ලබාගත් කොන්දේසි විරහිත ලංසු සුරක්ෂණයේ අංකය ............................

රු. ............................................. ක් සඳහා වූ ලංසු ඉදිරිපත් කිරීමේ ලියවිලි සඳහා (අයදුම්පත් ගාස්තු)
කුවිතාන්සි අංකය : ...........................................................

...................................................................................................................................... ලිපිනයේ පදිංචි (සම්පූර්ණ නම)................................................................... (ජා.හැ.අංකය) .............................
වන මම / අපි ඉහත සඳහන් **ලංසු ඉදිරිපත් කිරීමේ කොන්දේසි අනුව** කටයුතු කිරීමට එකඟ වෙමි. / වෙමු.

දිනය:..................................... ....................................
(ලංසුකරුගේ අත්සන)

ආපසු ගෙවනු ලබන තැන්පත් මුදල ගෙවූ රිසිට් පතේ ඡායා පිටපතක් හෝ හෝ පිළිගත් වාණිජ බැංකුවකින් ලබාගත් කොන්දේසි විරහිත ලංසු සුරක්ෂණයේ මුල් පිටපත මෙහි අලවන්න.

**'ආ' ආකෘතිය**

**පළමු පිටපත**

**ඌව පළාත් සභාවට අයත් ලංසු මඟින් විකිණීමට යෝජිත**
**අංක : ........................................ දරණ වාහනය සඳහා වූ ලංසු පත්‍රිකාවයි.**

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)
අයදුම්පත් අංක : ..................

ආපසු ගෙවනු ලබන තැන්පතු මුදල ගෙවීම
කුවිතාන්සි අංකය හෝ පිලිගත් වාණිජ බැංකුවකින්
ලබාගත් කොන්දේසි විරහිත ලංසු සුරක්ෂණයේ
අංකය : ........................

ලංසු පත්‍රිකා ගාස්තු ගෙවීමේ
කුවිතාන්සි අංකය : ...................

01. ලංසුකරුගේ නම :- ..............................................................................
02. ස්ථිර ලිපිනය :- ..............................................................................
..............................................................................
03. දුරකථන අංකය :-..............................................................................
04. ආයතනයක් නම් එහි නෛතික පුද්ගල නාමය :- ..............................................
05. ලියාපදිංචි සහතිකයේ අංකය :- ..............................................................
06. ලංසු ඉදිරිපත් කරනු ලබන වාහනයේ අංකය හා වර්ගය :- ......................................
07. ඉදිරිපත් කරනු ලබන ඉල්ලුම් මිල රුපියල් :- ..............................................
..............................................................................

(ඉලක්කමෙන් සහ අකුරින් පැහැදිලිව සඳහන් කළ යුතුයි)

08. ලංසු විවෘත කරනු ලබන අවස්ථාවට සහභාගී වන්නේද යන වග :- ..............................
09. නියෝජිතයෙකු සහභාගි කරවනු ලබන්නේ නම්, නියෝජිතයාගේ
10. නම:- ..............................................................................
11. ආදර්ශ අත්සන :- ..............................................................................
12. හැඳුනුම්පත් අංකය :- ..............................................................................

ඉහත සඳහන් පරිදි ඌව පළාත් සභවේ ලංසු මඟින් විකිණීමට යෝජිත අංක..........................දරණ.................................................................රථය සඳහා රුපියල් .................................................................................ක (අකුරින්) ගැණුම් මිලක් ඉදිරිපත් කර ඇත්තෙමි. ඒ අනුව එම මුදලට විකිණීම හෝ නොවිකිණීම පිළිබඳ ඌව පළාත් සභාවේ ප්‍රධාන ලේකම් / ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති / ටෙන්ඩර් මණ්ඩලය විසින් ගනු ලබන තීරණය අවසාන තීරණය ලෙස පිළිගැනීමට මා එකඟ වන බවත්, එම මුදලට විකිණීමට තීරණය කරනු ලබන බව දැනුම් දීමෙන් පසු සතියේ වැඩ කරන දින හතක් (07) ඇතුළත මුළු මුදලම ඌව පළාතේ ප්‍රධාන ලේකම් වෙත ගෙවා වාහනය නිදහස් කරගත යුතු දින වලින් අවසන් දිනයේ ප.ව. 3.30 ට පෙර වාහනය නිදහස් කරගනු ලබන බවත්, එසේ කිරීමට අපොහොසත් වුවහොත් ආපසු ගෙවනු ලබන ලංසු තැන්පතුව ඉල්ලා සිටීමට හිමිකමක් නොමැති බව පිළිගනු ලබන බවත් ප්‍රකාශ කර සහතික කර අත්සන් කරමි.

දිනය...............................

.....................................
(ලංසුකරුගේ අත්සන)
ජා.හැ.අංකය........................

**'ආ' ආකෘතිය**

**අනු පිටපත**

**ඌව පළාත් සභාවට අයත් ලංසු මගින් විකිණීමට යෝජිත**
**අංක : ........................................ දරණ වාහනය සඳහා වූ ලංසු පත්‍රිකාවයි.**

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)
අයදුම්පත් අංක : .................

ආපසු ගෙවනු ලබන තැන්පතු මුදල ගෙවීම
කුවිතාන්සි අංකය හෝ පිලිගත් වාණිජ
බැංකුවකින් ලබාගත් කොන්දේසි විරහිත
ලංසු සුරක්ෂණයේ අංකය : .......................

ලංසු පත්‍රිකා ගාස්තු ගෙවීමේ
කුවිතාන්සි අංකය : ...................

13. ලංසුකරුගේ නම :- ..............................
14. ස්ථිර ලිපිනය :- ..............................
..............................
15. දුරකථන අංකය :- ..............................
16. ආයතනයක් නම් එහි නෛතික පුද්ගල නාමය :- ..............................
17. ලියාපදිංචි සහතිකයේ අංකය :- ..............................
18. ලංසු ඉදිරිපත් කරනු ලබන වාහනයේ අංකය හා වර්ගය :- ..............................
19. ඉදිරිපත් කරනු ලබන ඉල්ලුම් මිල රුපියල් :- ..............................
..............................
(ඉලක්කමෙන් සහ අකුරින් පැහැදිලිව සඳහන් කළ යුතුයි)
20. ලංසු විවෘත කරනු ලබන අවස්ථාවට සහභාගී වන්නේද යන වග :- ............................
21. නියෝජිතයෙකු සහභාගි කරවනු ලබන්නේ නම්, නියෝජිතයාගේ
22. නම:- ..............................
23. ආදර්ශ අත්සන :- ..............................
24. හැඳුනුම්පත් අංකය :- ..............................

ඉහත සඳහන් පරිදි ඌව පළාත් සභවේ ලංසු මගින් විකිණීමට යෝජිත අංක........................... දරණ.................................................................... රථය සඳහා රුපියල් .......................................................................................ක (අකුරින්) ගැණුම් මිලක් ඉදිරිපත් කර ඇත්තෙමි. ඒ අනුව එම මුදලට විකිණීම හෝ නොවිකිණීම පිළිබඳ ඌව පළාත් සභාවේ ප්‍රධාන ලේකම් / ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති / ටෙන්ඩර් මණ්ඩලය විසින් ගනු ලබන තීරණය අවසාන තීරණය ලෙස පිළිගැනීමට මා එකඟ වන බවත්, එම මුදලට විකිණීමට තීරණය කරනු ලබන බව දැනුම් දීමෙන් පසු සතියේ වැඩ කරන දින හතක් (07) ඇතුළත මුළු මුදලම ඌව පළාතේ ප්‍රධාන ලේකම් වෙත ගෙවා වාහනය නිදහස් කරගත යුතු දින වලින් අවසන් දිනයේ ප.ව. 3.30 ට පෙර වාහනය නිදහස් කරගනු ලබන බවත්, එසේ කිරීමට අපොහොසත් වුවහොත් ආපසු ගෙවනු ලබන ලංසු තැන්පතුව ඉල්ලා සිටීමට හිමිකමක් නොමැති බව පිළිගනු ලබන බවත් ප්‍රකාශ කර සහතික කර අත්සන් කරමි.

දිනය................................

....................................
(ලංසුකරුගේ අත්සන)
ජා.හැ.අංකය...........................